සැ. යු.- 2013.11.22 දින පළ වූ අංක 1,838 දරන ගැසට් පත්‍රයේ I : III සහ III කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,839- 2013 නොවැම්බර් 29 වැනි සිකුරාදා - 2013.11.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහේස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බුද්දල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 2552 |

### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 දෙසැම්බර් මස 20 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 දෙසැම්බර් මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# විවිධ දැන්වීම්

## 1998 අංක 2 දරන ශ්‍රී ලංකා අභ්‍යන්තර සැලසුම්කරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීමේ යෝජිත පනතකි

පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝන් අමරතුංග වන මා විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයන්හි අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ "1998 අංක 2 දරන ශ්‍රී ලංකා අභ්‍යන්තර සැලසුම්කරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා යෝජිත පනත" යනුවෙන් යෝජිත පනතක් හඳුන්වා දීමට යෝජනා කර ඇති බව මෙයින් දන්වා සිටිමි.

මෙම යෝජිත පනතේ අරමුණ වන්නේ, පහත දැක්වෙන කොටස් එකතු කිරීම සඳහා සංස්ථාවේ සාමාන්‍ය බලතල යටතේ පනතේ 4 වැනි වගන්තිය සංශෝධනය කරලීමයි.

1. සංස්ථාවේ සාමාජිකත්වය, අභ්‍යන්තර සැලසුම්කරන ක්ෂේත්‍රයේ සියලු පරිචායකයින් (සේවා නියුක්ති වෘත්තිකයින්) සඳහා වන අවශ්‍යතාවයක් වන අතර වෘත්තියවේදී තත්ත්වය පිළිගැනීමක් හා අභ්‍යන්තර සැලසුම්කරු අභ්‍යන්තර ගෘහ නිර්මාණ ශිල්පී (වාස්තු විද්‍යාඥ) අභ්‍යන්තර තාක්ෂණඥ සහ අභ්‍යන්තර අලංකාරකයන් (විභූෂකයින්) සඳහා පරිචයන (සේවා නියුක්ති) බලපත්‍රයක් ද වන අතර එය අවශ්‍යතා සම්පූර්ණ කෙරෙන, සංස්ථාවේ අනුමැතිය ලබාගත් හා නීති රෙගුලාසි සහ ආචාර ධර්ම පද්ධතියට අනුකූලව ක්‍රියාකරන අය සඳහා වේ.

2. සංස්ථාව, අභ්‍යන්තර සැලසුම්කරණ ක්‍ෂෙත්‍රයේ වරලත් තත්ත්වය (වරලත් අභ්‍යන්තර සැලසුම්කරු), පිළිගැනීමක් ලබාගැනීම සඳහා සුදුසුකම් හා විශේෂඥතාවය සහිත අයහට එම තත්ත්වය ප්‍රදානය කරලීම සඳහා වගකීම දරන ආයතනය වේ.

3. සංස්ථාව මනා සැලසුම්කරු වටිනාකමක් හා නිෂ්පාදන තත්ත්වයක් සහිත එවන් අභ්‍යන්තර නිපැවුම් සඳහා වෙළඳපල පිළිගැනීම සඳහා වන තත්ත්ව ආරක්ෂණ සහතිකයක් ලබාදෙනු ඇත.

4. සංස්ථාවේ නිර්දේශය, අභ්‍යන්තර අලංකරණ සහ අභ්‍යන්තර තාක්ෂණවේද ක්ෂේත්‍රයේ තාක්ෂණික කුසලතා පිළිබඳ නිපුණතාවය සඳහා සහතික පත්‍ර පිරිනැමීම සඳහා අවශ්‍යවනු ඇත.

5. සංස්ථාව, අභ්‍යන්තර සැලසුම්කරණ අධ්‍යාපනය පිළිබඳ ඉහළ ප්‍රමිතීන් තහවුරු කරලීම සඳහා විෂය ධාරාව සංවර්ධනයට සහාය වනු ඇත.

ජෝන් අමරතුංග,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
ගම්පහ දිස්ත්‍රික්කය.

11-977

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.